03

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර පළමු අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019 අගෝස්තු / සැප්තැම්බර්
ආර්ථික විද්‍යාව

**ECON 3120.3 / ECON 3120.03** - සංවර්ධන න්‍යාය

කාලය පැය තුන (03)යි.

පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න. පැහැදිලි අත්අකුරු පිළිබඳ සැලකිලිමත්වන්න.

01. සෘජු හා කෙටි පිළිතුරු සපයන්න.

i). සංවර්ධනයේ ප්‍රධාන පරමාර්ථය කුමක් ද?

ii). ඇඩම් ස්මිත් දක්වන ආර්ථික සංවර්ධනයේ විචල්‍යයන් මොනවාද?

iii). ආර්ථික වර්ධනයේ ප්‍රධාන සංරචකයන් දෙකක් (02) නම් කරන්න.

iv). නිරපේක්ෂ දරිද්‍රතා මට්ටම යනු කුමක් ද?

v). ගිනි සංගුණකයෙන් මනිනු ලබන්නේ කුමක් ද?

vi). අභ්‍යන්තර ජනන වෘද්ධි න්‍යායයේ විශේෂත්වය කුමක් ද?

vii). මානව සංවර්ධන දර්ශකයෙහි සංරචක දෙකක් (02) නම් කරන්න.

viii). හැරඩ්-ඩෝමාර් වර්ධන ආකෘතියෙහි ප්‍රධාන උපකල්පන දෙකක් (02) දක්වන්න.

ix). ආතර් ලුවිස් දක්වන ආර්ථිකයේ ද්විත්ව ස්වරූප යටත් විජිත ශ්‍රී ලංකාව ආශ්‍රයෙන් පහදන්න.

x). ඩේවිඩ් රිකාඩෝට අනුව ප්‍රාග්ධන රාශීකරණයේ සංරචකයන් මොනවාද?

(ලකුණු 02x10)

02. අ). ආර්ථික සංවර්ධනයෙහි අත්‍යාවශ්‍ය කොන්දේසිය කුමක් ද? කෙටියෙන් පහදන්න. (ලකුණු 05)

ආ). ඩඩ්ලි සියර්ස් පෙන්වාදෙන පරිදි සංවර්ධනයේ ලක්ෂණ මොනවාද? (ලකුණු 07)

ඊ). ආර්ථික සංවර්ධනය මිනුම් කළ යුත්තේ ඇයි? හේතු දක්වන්න. (ලකුණු 08)

03. අ). විවිධ සංවර්ධන න්‍යායයන් මඟින් විභාග කරනු ලබන අඩු සංවර්ධනයක් සහිත රටවල් සම්බන්ධයෙන් පවතින පොදු ලක්ෂණ ලැයිස්තුගත කරන්න.

(ලකුණු 07)

ආ). සංවර්ධිත රටවල් සංවර්ධන ක්‍රියාවලියේ දී මුහුණපාන ගැටලු මොනවාද? (ලකුණු 04)

ඉ). ''මානව සංවර්ධනය දර්ශකයට අනුව සංවර්ධිත රටවල මට්ටමට ළඟාවීමට ඇතැම් අඩු සංවර්ධනයක් සහිත රටවලට හැකි වී ඇත.'' උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 09)

04. අ). ආර්ථික සංවර්ධනය පිළිබඳ සම්භාව්‍ය අදහස්වල දැකගත හැකි පොදු විශේෂතා මොනවාද?

(ලකුණු 07)

ආ). රොබට් සෝලෝට අනුව රටක සංවර්ධනයේ තීරක සාධකය කුමක් ද? පහදන්න.

(ලකුණු 05)

ඉ). ''හැරඩ්-ඩූමාර් වර්ධන ආකෘතිය රටක සංවර්ධනය සඳහා ආයෝජනය අත්‍යවශ්‍ය බව පෙන්වාදුන්නද එහි කාර්යභාරය පැහැදිලි කර නොමැත.'' මෙම ප්‍රකාශයෙහි සත්‍ය අසත්‍යතාව හේතු සහිතව පහදන්න.

(ලකුණු 08)

05. අ). කාල් මාක්ස් පෙන්වාදුන් රටක සංවර්ධනයේ ප්‍රධාන අවධි නම්කර ලුහුඬින් විස්තර කරන්න.

(ලකුණු 06)

ආ). ''නාගරික අංශයේ ව්‍යාපාරිකයින් ලාභය නැවත ආයෝජනය කිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් ග්‍රාමීය නාගරික ශ්‍රම සංක්‍රමණය සිදු වේ.'' ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න.

(ලකුණු 07)

ඉ). ග්‍රාමීය නාගරික වැටුප් සන්සන්දනය කිරීමෙන් පමණක් ශ්‍රම සංක්‍රමණයක් සිදු නොවන බව සුදුසු සංවර්ධන ආකෘතියක් ආශ්‍රයෙන් විභාග කරන්න.

(ලකුණු 07)

06. අ). සමබර වර්ධනය පිළිබඳ රග්නාර් නර්ක්ස්ගේ අදහස් පහදන්න.

(ලකුණු 06)

ආ). සංවර්ධනය මිනුම් කිරීමේ නවීන දර්ශකයන් මොනවාද? පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඉ). ආර්ථික සංවර්ධනයේ දී පරිසරයට ලබා දී ඇති වැදගත්කම සංවර්ධන දර්ශක ඇසුරින් විභාග කරන්න.

(ලකුණු 06)

**************